**ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතිය - 2016**

---

ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ ඔපෙක් අරමුදල අතර 2013 ජූනි 10 දින එළඹි අංක 15111පීබී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන මහා මාර්ග කිලෝමීටර් 65.45 ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 12,347.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99 ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57 කට සමාන එ.ජ.ඩො.මිලියන 50 ක් සැපයීමට ජාත්‍යන්තර සංවිධානය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින්

ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන වග,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ කරන ලද ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේ ද යන බව,

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(ඌ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

**(එ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

රු.මිලියන 6.94 ක මුදලක් බස්නාහිර පළාත් ජාතික මහා මාර්ග ව්‍යාපෘතිය සහ මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා යොදවා ඇති අතර එම වියදම ඉඩම් අත්පත් කරගැනීමේ වියදම් ලෙස ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය විය.

**2.2.2 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

---

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 චක්‍රලේඛයේ 2.2 ඡේදයට අනුව සහ ලංසු ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමකින් තොරව ව්‍යාපෘතිය විසින් බාහිර උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

---

**3.1 අරමුදල් උපයෝජනය**

---

මූල්‍යායනය, සමලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ඔපෙක් ණය | 50.00 | 6,499.57 | 481.96 | 2.54 | 331.22 | 8.88 | 1,177.66 |
| ශ්‍රී.ලං.ර | 44.99 | 5,847.80 | 1,690.00 | - | 162.38 | - | 2,115.03 |
| එකතුව | 94.99 | 12,347.37 | 2,171.96 | 2.54 | 493.60 | 8.88 | 3,292.69 |

නිශ්චිත වේලාව තුල ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට හැකිවන පරිදි අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක ආවරණය කර ගැනීම සඳහා වන පරිපූර්ණ සමස්ථ සැලැස්මක් මාසික, කාර්තුමය හෝ වෙනත් ආකාරයකට පිළියෙල කර නොතිබුණි. තවද, සමාලෝචනයට ලක්වූ වර්ෂය තුල ළඟාකර ගත් මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් 2016 ජූලි සිට 2016 දෙසැම්බර් දක්වා ප්‍රගති වාර්තා ව්‍යාපෘතිය මගින් පිළියෙල කර නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

----------------------

ව්‍යාපෘතියේ මුල් විෂයපථය අනුව කොළඹ නගරාසන්න ප්‍රදේශවල කිලෝ මීටර් 65.45 ක මාර්ග කොන්ත්‍රාත් පැකේජ 07 ක් යටතේ පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව, 2016 ජූලි 15 දින වන විට ශ්‍රී ජයවර්ධනපුර රෝහල, දෙමටගොඩ - වැල්ලම්පිටිය, කොළොන්නාව - යක්බැද්ද, වැලිකඩ - කොහිලවත්ත, මට්ටක්කුළිය අලුත්වත්ත මාර්ගය සහ මට්ටක්කුළිය මධ්‍යම මාර්ගය යන මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කටයුතු කිලෝ මීටර් 12.07 කින් කොන්ත්‍රාත් පැකේජ අංක 02 යටතේ අවසන් කර තිබුණි. අවශ්‍ය අනුමැතිය ලබා නොගැනීම, ඉඩම් අත්පත්කරගැනීම් ප්‍රමාදවීම වැනි හේතූන් නිසා කිලෝ මීටර් 49.54 කින් යුක්ත කොට්ටාව - තලගල මාර්ගය, කෝට්ටේ - බෝපේ මාර්ගය, ඕරුගොඩවත්ත - අඹතලේ මාර්ගය, වල්ගම - දියගම මාර්ගය, මොරටුව - පිළියන්දල මාර්ගය, නාවින්න - බොරලැස්ගමුව මාර්ගය හා පිළියන්දල - මහරගම මාර්ගය යන මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහාවූ කොන්ත්‍රාත් 2016 දෙසැම්බර් 31 වන විටත් භාරදී නොතිබුණි. තවද, අංක 2/1 දරන නාරාහේන්පිට - නාවල - නුගේගොඩ මාර්ගය (නාවල පාලම) පුළුල් කිරීම අවසන් කර 2015 මාර්තු 10 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සාධාරණ හේතුවකින් තොරව කිලෝ මීටර් 2.41 ක් වූ නාවින්න - බොරලැස්ගමුව මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු මුල් විෂය පථයෙන් ඉවත් කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් ඒ සඳහා වලංගු හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

**(ආ)** ලැබුණු තොරතුරුවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට පෞද්ගලික ඉඩම් කැබලි 1941 ක් සහ රජයේ ඉඩම් කැබලි 502 ක් අත්පත් කරගෙන ඇති අතර ඒ සඳහා රු.මිලියන 1,469.17 ක මුදලක් වන්දි ලෙස ගෙවා තිබුණි. කෙසේවුවද, 2016 දෙසැම්බර් 31 දිනට අංක 44 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතට අනුව ඉඩම් කැබලි 2,668 ක අයිතිය අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරා දී තිබුණි.